කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය**

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**2022 මැයි මස 10 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 මැයි මස 09 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට **මි.මී. 75 ට වැඩි** තරමක් තද වැසි ඇතිවිය හැක.

ඌව සහ නැගෙනහිර පළාත්වල සවස් කාලයේදී හෝ රාත්‍රි කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින හරහා, විශේෂයෙන් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශ වලත් උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත්වලත් හම්බන්තොට සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලත් සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (40-50)** පමණ දක්වා වැඩිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 10 May 2022**
**Issued at 1200 noon on 09 May 2022**

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa and Central provinces and in Galle and Matara districts. Fairly heavy showers **above 75 mm** may occur at some places in these areas.

Showers or thundershowers may occur at a few places in Uva and Eastern provinces during the evening or night.

Winds speed can increase up to **(40-50) kmph** at times over the island particularly in Western slope of the Central hills, Northern, North-central and North-western provinces and in Hambantota and Trincomalee districts.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2022 මැයි මස 09 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**ගිණිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති "අසනි" සුළි කුණාටුව, චණ්ඩ සුළි කුණාටුවක් බවට වර්ධනය වී ඇති අතර මැයි 09 වන දින 0530 පැය වනවිට උතුරු අක්ෂාංශ 13.7 (N) සහ නැගෙනහිර දේශාංශ 86.3 (E) ආසන්නයේ, ත්‍රිකුණාමලයේ සිට කි.මී. 800 ක් පමණ ඊසාන දෙසින් කේන්ද්‍රගත වී පැවතිණි. එය මැයි 10 වන දින දක්වා වයඹ දෙසට ගමන් කර බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක ප්‍රදේශය වෙත පැමිණීමටත් ඉන්පසුව උතුරට බරව ඊසාන දෙසට හැරී වයඹ දිග බෙංගාල බොක්ක ප්‍රදේශය වෙත ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට කොළඹ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර හෝ නිරිත දෙසින් හමා එයි. සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම, කොළඹ, මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී.(50-60)** පමණ දක්වා වැඩි වේ.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම, කොළඹ, මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළුවේ. සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
## Issued at 1200 noon on 09 May 2022

**The Cyclonic storm ("Asani") over the southeast Bay of Bengal has intensified into a severe Cyclonic storm and lay centered at 0530hrs on 09$^{th}$ of May near 13.7N and 86.3E, about 800km northeast of Trincomalee. It is very likely to move northwestwards till 10$^{th}$ May and reach westcentral Bay of Bengal. Thereafter, it is likely to recurve north-northeastwards and move towards northwest Bay of Bengal.**

**Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Puttalam to Matara via Colombo and Galle.

**Winds:**

Winds will be westerly or south-westerly and wind speed will be **(30-40) kmph**. Wind speed can increase up to **(50-60) kmph** at times in the sea areas off the coast extending from Kankasanturai to Potuvil via Mannar, Puttalam, Colombo, Matara and Hambantota. Wind speed can increase up to **50 kmph** at times in the other sea areas.

**State of Sea:**

The sea areas off the coast extending from Kankasanturai to Potuvil via Mannar, Puttalam, Colombo, Matara and Hambantota will be rough at times and the other sea areas around the island may be fairly rough.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**